| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | **දෙවන වාර පරීක්ෂණය - 2025** |
| **10 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II** |

නම/විභාග අංකය................................ කාලය: පැය තුනයි

සිංහල භාෂාව හා සාහිත්‍යය - I

**උපදෙස්:**

(I) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
(II) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

**★ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

(1) පසුගිය දවස්වල හමා ගිය තද කුණාටුවෙන් අපේ ගහ කොළ ගෙවල් දොරවල් **සුනේ සුං** විය.
(1) කැඩී බිඳී ගියේ ය. (2) විනාශ වී ගියේ ය.
(3) ඉරි තැළී ගියේ ය. (4) පුපුරා ගියේ ය.

(2) විදේශගත වූ පුතාගේ පැමිණීම නිසා ඔවුන්ගේ **කරල පැහිලා** යැයි අම්මා කීවා ය.
(1) විනාශය ළං වෙලා (2) කුඹුර පැහිලා
(3) හොඳ කාලයක් ලබලා (4) නරක කාලයක් ලබලා

(3) ඇතැම් දේශපාලකයෝ **මූණ බලා** නිලතල ලබා දීමට තැත් කරති.
(1) හිතවත්කමට (2) ඥාතිකමට
(3) අල්ලසට (4) තුටු පඬුරු ලෙසට

**★ අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(4) සැම මනුෂ්‍යයකුගේ ම යුතුකම විය යුත්තේ තම තමන්ගේ සංස්කෘතියේ ......................රැක ගැනීම ය.
(1) අනුකූලතාව (2) අනුබද්ධතාව (3) අනන්‍යතාව (4) අඛණ්ඩතාව

(5) ධරණීතලයේ වෙසෙන සැම ජීවියකුගේ ......................සිදු වූයේ මහ සාගරය ආශ්‍රිතව යැයි ඇතැම් ජීව විද්‍යාඥයෝ විශ්වාස කරති.
(1) සම්මිශ්‍රණය (2) සම්ප්‍රාප්තිය (3) සම්භාවිතාව (4) සම්භවය

(6) නව ව්‍යාපාරයේ වාර්ෂික ...................පිළිබඳව ඉමහත් ලෙස සතුටු විය හැකි බව එහි ප්‍රධානියා ප්‍රකාශ කළේ ය.
(1) අගතිය (2) ප්‍රගතිය (3) ප්‍රමිතිය (4) දුගතිය

(7) අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) ඉංගිරිය, පිළියන්දල, මත්තේගොඩ, මීගමුව
(2) අතුරුගිරිය, හෝමාගම, නුගේගොඩ, බේරුවල
(3) අවිස්සාවේල්ල, හංවැල්ල, හොරණ, මතුගම
(4) අලුත්ගම, කැලණිය, කඩුවෙල, කළුතර

(8) සැම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) විමර්සන, ප්‍රවීණ, න්‍යෂ්ඨි, විෂ්ණු
(2) රමණීය, ග්‍රහණය, ආකර්ෂණ, කනිෂ්ඨ
(3) දේශන, ආශ්වාස, කෞසල්‍යය, ශ්‍රවණ
(4) පළල, ගර්ෂණය, භාෂණ, ප්‍රශස්ති

(9) කෙටි ඇදපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල පිළිවෙළින් දෙවන අකුරෙහි යෙදී ඇති වරණය තෝරන්න.

(1) විදුහල, පෙරත්ත, වැලිපෙත, පෙරාතුව
(2) පෙරාතුව, විදුහල, පෙරත්ත, වැලිපෙත
(3) පෙරත්ත, පෙරාතුව, වැලිපෙත, විදුහල
(4) වැලිපෙත, පෙරාතුව, විදුහල, පෙරත්ත

(10) මුලින් දී ඇති ක්‍රියා පද වර්ගයට අයත් පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පූර්ව ක්‍රියා - පැමිණ, කා දමා, නටමින්, හැඳ
(2) අසම්භාව්‍ය ක්‍රියා - හඬන කළ, පැළඳ, බලද්දී, හැරෙත්
(3) ප්‍රයෝජ්‍ය ක්‍රියා - පිසවයි, අඬවයි, වට්ටයි, රක්වයි
(4) විධි ක්‍රියා - බලන්න, බොනු, කන්න, ගයනු

(11) අනියමාර්ථයේ අනුක්ත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මම, මා, අපි, අප
(2) ළමයෙක්, මිනිසෙක්, ගැහැනියක්, අශ්වයෙක්
(3) දරුවෙකු, කාන්තාවක, කුමරියක, ගිරවකු
(4) ඈ, එයාලා, ඒගොල්ලෝ,ඔහු

(12) මුලින් දී ඇති පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදි ව වෙන් කොට දක්වා ඇති වරණය තෝරන්න.

(1) සතුරෝ - සතුරා + ඕ
(2) පුතා - පුත් + අ
(3) මල්ල - මලු + ආ
(4) මිතුරනි - මිතුරු + අනි

(13) "යකඩින් කරන ලද" යන යෙදුම සඳහා සුදුසු තනි පදය වන්නේ,

(1) යබොරමය යන්නයි (2) අයෝමය යන්නයි (3) යදමය යන්නයි (4) යකඩමය යන්නයි

★ **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් යුත් කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(14) භික්ෂුව **සතතාභ්‍යාසයෙහි** යෙදී ම පිරිවෙන් අධ්‍යාපනයේ අනිවාර්ය කටයුත්තකි.

(1) අඛණ්ඩව අධ්‍යයනය කිරීම (2) විනයානුකූල වීම (3) කට පාඩම් කිරීම (4) අභ්‍යාස වැඩිපුර කිරීම

(15) භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ **අවියෝජනීය** සම්බන්ධයකි.

(1) වෙනස් (2) වෙන් කළ හැකි (3) වෙන් කළ නොහැකි (4) දැඩි

(16) අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් සේනාධීරගේ සිතෙහි ඇති වන **<u>ප්‍රහර්ෂය</u>** කුළු ගැන්වෙයි.

(1) අනුරාගය (2) සංවේගය (3) උදාරත්වය (4) අධික සන්තෝෂය

(17) දී ඇති වචන අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය වන්නේ,

(1) ගිටාරය, වයලීනය, වීණාව, සිතාරය (2) බස් රථය, ගුවන් යානය, දුම්රිය, මෝටර් රථය
(3) කියත, නියන, මිටිය, අඬුව (4) උපමා, රූපක, එළිසමය, අනුප්‍රාස

(18) දී ඇති අක්ෂර නිවැරදි ව ගැළපීමෙන් නිර්මාණයවන ග්‍රන්ථ නාමය සහිත වරණය තෝරන්න.

(1) දේ බැ ග ද් ම (2) ම ල් දු ඩො ය (3) පෙ මි ග ර වි ය (4) ඔ අ එ යා මෝ

(19) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය කුමක්ද?

(1) සකලයෝ - පක්ෂීහු, සියොත්හු, කුරුල්ලෝ, විහඟයෝ
(2) බුහුටියේ - දක්ෂයෝ, ප්‍රවීණයෝ, සූරයෝ, සමත්තු
(3) සාමුවෝ - වානරයෝ, ශාඛා මෘගයෝ, වානරාජයෝ, වඳුරෝ
(4) අනුවණයෝ - මන්දබුද්ධිකයෝ, මොට්ටයෝ, මෝඩයෝ, බුද්ධිහීනයෝ

(20) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන පිළිතුර කුමක්ද?

(1) මුදිත - අමුදිත (2) විවාද - සංවාද (3) කීර්තිය - අපකීර්තිය (4) බාල වයස - පශ්චිම වයස

(21) අර්ථ විරහිත යුගල පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) යන එන, බාල මහලු, සමිති සමාගම්, දුගී දුප්පත් (2) හරක බාන, ඔප්පු තිරප්පු, ගුණ අගුණ, මිල මුදල්
(3) වංහුං, ලට්ට ලොට්ට, අනං මනං, දණි පණි (4) ගනු දෙනු, ඇනුම් බැනුම්, කොට්ට මෙට්ට, ගුණ දොස්

(22) වැරදි අදහස සහිත වරණය කුමක්ද?

(1) ව්‍යඤ්ජනයකට පර ව බැඳෙන ''ය'' වෙනුවට යංශය යෙදේ.
(2) ව්‍යඤ්ජනයට පෙර හල් ව යෙදෙන ''ර'' වෙනුවට රේඵය යෙදේ.
(3) ''ඥ'' යනු ජ් + ඤ යන අක්ෂර දෙකේ සම්මිශ්‍රණයෙන් සැදුණු බැඳි අක්ෂරයකි.
(4) ''ර්'' ව්‍යඤ්ජනයට ''ඇ'' ස්වරය එක් වීමෙන් රකාරාංශය යෙදේ.

(23) මේවායින් ''පූර්ණ නාසික්‍යය'' තෝරන්න.

(1) (අඃ) (2) (අං) (3) ඤ (4) ඬ

★ **අංක 24 සිට 26 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති ප්‍රස්තාව පිරුළෙහි වඩාත් ගැළපෙන අදහස සහිත පිළිතුර තෝරන්න.**

(24) ගුරුන්ටත් අකුරු වරදිනව ලු

(1) කොයි කාගෙ අතිනුත් වැරදි සිදුවන බව (2) ගුරුවරුන් අතින් වැරදි සිදුවන බව
(2) උසස් අය අතිනුත් බොහෝ වැරදි විය හැකි බව (4) උසස් අය අතිනුත් සුළු වැරැද්දක් විය හැකි බව

(25)අතු කඩා මොර කන්නා වගේ

(1) යම් කාර්යයක් ඉතා පහසුවෙන් කර ගැනීම
(2) ඉතා අමාරුවෙන් දෙයක් කිරීම
(3) යමක් විනාශ කරමින් ප්‍රයෝජනයට ගැනීම
(4) නිෂ්ඵල කාර්යයක් කිරීම

(26) අන්දරේ සීනි කෑවා වගේ

(1) අන්දරේ විහිළු කර සීනි කෑම
(2) අන්දරේ සිය සතුට ප්‍රකාශ කළ මාර්ගය
(3) ජීවිතේ සැහැල්ලු බව කියා පෑම
(4) උපක්‍රමික වශයෙන් තම අදහස ඉටු කර ගැනීම

★ **අංක 27 සිට 31 තෙක් ප්‍රශ්නවලට ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(27) (1) මම එය කියවා නැත.
(2) ඕ තොමෝ ගමට ගියාය.
(3) දක්ෂ ක්‍රීඩිකාවක් වන්නේ කෙසේ ද?
(4) ඔවුන් තම කටයුතු නිම කළහ.

(28) (1) ඈ නිළියක් වූවාය.
(2) ඔහු ලේඛකයෙකු ද?
(3) නුඹලා අනාගත නායකයන් ලු.
(4) අපි සියල්ලන් ම ශ්‍රී ලාංකිකයෝ.

(29) (1) මිනිසුන් පාලම අලුත් වැඩියා කරති.
(2) මිනිස්සු අන්තවාදය තේරුම් ගත යුතුය.
(3) මම කිසි දිනක බොරු කියා නැත.
(4) පයින් යන්නන් දකුණු පසින් යා යුතුය.

(30) (1) සොරු දෙදෙනෙකු අත් අඩංගුවට පත් වූහ.
(2) හෙතෙම පාඩමට සූදානම් වූහ.
(3) ඔවුන් එය වටහා ගැනීම යෙහෙකි.
(4) තෙපි සත්‍යගරුක විය යුත්තෝය.

(31) (1) සිසුන් නියමිත වෙලාවට පාසලට පැමිණිය යුත්තෝය.
(2) අද වෛද්‍යවරුන් රෝහලේ නැත.
(3) පයින් යන්නෝ පාරේ දකුණු පසින් ගමන් කිරීම මැනවි.
(4) සමිතිය අවසානයේ සභාතුමූ විසිර ගියහ.

(32) (I) බලධාරීහු නාය යෑම් ..................අවධානයෙන් පසු වෙති.
(II) අප පින්................වැඩ කිරීම යෙහෙකි.
(III) කම්කරුවෝ රට ...............වෙහෙසෙති.
(IV) අම්මා අප එන.................බලා සිටියි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(E) තුරු  (F) තකා  (G) පිළිබඳ  (H) වෙනුවෙන්

(1) GEFH  (2) HGEF  (3) GFHE  (4) GFEH

(33) "ඇගේ දසන් මුතු පෙළ බඳු ය" යන වැකියේ උපමේය වන්නේ,

(1) ඇගේ  (2) මුතු පෙළ  (3) දසන්  (4) බඳු

(34) 'බල' යන ප්‍රකෘතියෙන් සෑදිය හැකි මධ්‍යම පුරුෂ ඒක වචන අතීත කාල ක්‍රියා පදය වන්නේ,

(1) බැලීහි (2) බලහි (3) බලන්නෙහි (4) බැලෙහි

(35) 'මතුපිට අර්ථය ඉක්මවා යන සැඟවුණු අර්ථ සහිත' යන වාක්‍ය ඛණ්ඩය වෙනුවට යෙදිය හැකි සුදුසුම යෙදුම වන්නේ,

(1) වාච්‍යාර්ථය (2) ධ්වනිතාර්ථය (3) වාක්‍යාර්ථය (4) ව්‍යුත්පත්තිය

(36) "රත්න දීප ජන්ම භූමි - ලංකා දීප විජය භූමි" කාව්‍ය නිර්මාණයේ රචකයා වන්නේ,

(1) ගුණදාස අමරසේකර (2) විමල් දිසානායක (3) මහගම සේකර (4) රත්න ශ්‍රී විජේසිංහ

(37) මොනරාගල වහරින් 'කිරි අල' හැඳින්වීමට යෙදෙන නිවැරදි වරණය තෝරන්න.

(1) ඉඟුරු (2) පැපොල් (3) පුහුල් (4) කොකිස්

(38) හේන් ගොවිතැනේ දී 'අක් වැස්ස' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) හේන් වගා කිරීමෙන් පසුව ලැබෙන වර්ෂාව

(2) හේන් අස්වනු නෙලීමේ දී ලැබෙන වර්ෂාව

(3) හේන් ගිනි ලෑමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව

(4) හේන් කෙටීමට පෙර බලාපොරොත්තුවන වර්ෂාව

(39) 'හුණු වටය' වේදිකා නාට්‍යයෙහි අඩංගු නොවන චරිතයක් වන්නේ,

(1) මනමේ (2) ගෘෂා (3) අසඩක් (4) නටාලියා

(40) පහත සඳහන් පාඨයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

'සාහිත්‍යකරුවා සිය නිර්මාණයට පාදක කර ගන්නා අද්දැකීමෙහි විශ්වසනීයභාවය තහවුරු කිරීමට ඔහුගේ භාෂා භාවිතය ඉවහල් වේ.'

(1) භාෂාව සාහිත්‍යකරුවාගේ අද්දැකීම විශ්වසනීය ලෙස පිළිබිඹු කරයි.

(2) භාෂාව යනු සාහිත්‍ය නිර්මාණයක විශ්වාසය ගොඩ නගන සාධකයයි.

(3) භාෂාව තුළින් විශ්වසනීය සාහිත්‍ය අද්දැකීමක් නිර්මාණය වේ.

(4) භාෂාව සාහිත්‍යකරුවා තුළ අද්දැකීමෙහි විශ්වසනීයභාවය ඇති කරයි.

| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 10 ශ්‍රේණිය | **සිංහල භාෂාව හා සාහිත්‍යය** -I, II |

නම/ විභාග අංකය: ……………………………………

**සිංහල භාෂාව හා සාහිත්‍යය - II**

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල අක්ෂර මාලාවේ පහත සඳහන් අක්ෂර කාණ්ඩ නම් කරන්න.
(අ) ග, ජ, ඩ, ද, ඕ (ආ) ඞ, ඤ, ණ, න, ම

ii. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) පතල (ආ) පතළ

iii. පහත සඳහන් නාම පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කරන්න.
(අ) දූරිය (ආ)උගත්තු

iv. පහත වචනවලට අනුක්ත පද ලියන්න.
(අ) විද්වත්හු (ආ) කාන්තාවක්

v. (අ) "නටයි" යන්නෙහි කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව ලියන්න.
(ආ) "කපති" යන්නෙහි ප්‍රයෝජ්‍ය ක්‍රියාව ලියන්න.

vi. මොනරාගල දිස්ත්‍රික්කයේ භාවිතා වන පහත සඳහන් පද සඳහා පොදු ව්‍යවහාරයේ යෙදෙන පදය ලියන්න.
(අ) දොරවල් (ආ) පුහුල්

vii. පහත සඳහන් පද සඳහා සමානාර්ථ පදය බැගින් ලියන්න.
(අ) මිදුල (ආ) ප්‍රාකාරය

viii. පහත දක්වෙන පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) ආගන්තුක (ආ) විවේකි

ix. පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු ප්‍රස්තාව පිරුළ ලියන්න.
(අ) පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදුවීම.
(ආ) අවදානම් ක්‍රියාවක් වෙනත් අයෙකු ලවා කරවා ගැනීම.

x. පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) ප්‍රධානියා නව සේවිකාවක බඳවා ගත්තේය.

(ආ) නැට්ටුවෝ පෙරහැරේ නටති.

(ලකුණු 2× 10 = 20)

(2) පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ස්වාභාවික විපත් පිළිබඳ පුවත්, ලොව බොහෝ රටවලින් නිතර අසන්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ද මෙබඳු සිදුවීම් ඇතිවේ. න්‍යෂ්ටික අත්හද බැලීම් හා පාරිසරික ගැටලු ද මේ සඳහා හේතු වන්නට ඇත. ස්වාභාවික විපත් අවම කර ගැනීමට යෝග්‍ය ක්‍රියාමාර්ග යෙදීම අප කාගේත් යුතුකමකි.

(ආ) දේශීය සංස්කෘතිය හා බැඳුණු නිවැරදි ආහාර රටාවකට අනාදිමත් කාලයක සිට උරුමකම් කියූ අපි පහසුව හා කාලය ඉතිරි කර ගැනීමේ අවශ්‍යතාව නිසා මෙරට මෙන් ම පිටරට ද නිෂ්පාදිත කෘත්‍රිම ආහාරවලට ඇබ්බැහි වෙමින් සිටිමු. මෙමගින් ක්ෂණිකව මෙන් ම දීර්ඝකාලීනව ද අතුරු විපාක විඳීමට ඉඩ ඇති බවට පළකෙරෙන මත ගැන ද නිතර අසන්නට ලැබේ. මෙබඳු කෘත්‍රිම ආහාර පාන පරිභෝජනයේ යෝග්‍යතාව විමසීමට ලක්විය යුතුය.

(ඉ) පැරණි ශ්‍රී ලාංකික සමාජය ගොඩනැගීමට මුල් වූයේ වාපි සංස්කෘතියයි. ස්වාභාවික හා පාරිසරික වෙනස්වීම් මැනවින් හඳුනාගෙන වැව් ජලය උපයෝගී කරගෙන ගොවිතැනෙහි යෙදුණු අපේ මුතුන්මිත්තෝ මේ රට සහලින් ස්වයංපෝෂිත කළහ. ඔවුන් විසින් දයාද කරන ලද සංස්කෘතිය අප ලද වටිනා සම්පතකි. මෙබඳු සම්පතක් ලෝකයේ වෙනත් රටවල දක්නට නොමැත.

(ඊ) ගීතය යනු රසිකයා අතර අමරණීය වින්දනයක් ගොඩනගන කලා නිර්මාණයකි. වින්දනය පමණක් නොව ගීතය තුළින් පුළුල් ජීවිතාවබෝධයක් ද ලැබේ. අතීත ගීතය හා වර්තමාන ගීතය දෙස බලන විට නූතන ගීතය බෙදනීයත්වයෙහිලා සැලකිය හැකිය. ගීතයක් යනු හුදෙක් ම අරුත් සුන් කලා නිර්මාණයක් නොවේ. රසිකයා ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යන අර්ථ පූර්ණ සුභාවිත නිර්මාණයකි.

(ලකුණු 25)

(3) පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අධ්‍යයන කාර්යයෙහි හා දරුවන් හද වඩා ගැනීමේ කාර්යයෙහි නියුක්ත සැවොම මෙම පරිගණක ක්‍රියාවලිය නිවැරදිව වටහා ගත යුතු ය. ඇඟිලිවල මාංශපේශි නිසි අන්දමට වැඩෙන්නට පෙර අකුරු ලියවීම, ඇස්වල මාංශපේශි නිසි ලෙස වැඩෙන්නට පෙර අකුරු කියවීමට තැත් කිරීම, කකුල් හරි හැටි ශක්තිමත් වීමට පෙර ඇවිදින්නට තැත් කිරීම යන මේ සියල්ල ස්වභාවික පරිණතිය හා සංවර්ධන රටාව නොදන කරන අනුවණකමිය. මේ නිසා දෙමව්පියන් ළදරු පාසල් ගුරුවරියන් හා ප්‍රාථමික පාසල් ගුරුවරියන් විශේෂයෙන් ම දරුවන්ගේ පරිණතිය තේරුම් ගෙන තම ඉගැන්වීමේ කාර්යය සැලසුම් කළ යුතු වේ. දරුවා ඇල්ලීමට, ලිවීමට, කියවීමට පෙර කායිකව පරිණත වී නැත්නම් මානසික සූදනමක් ඇති නොවේ. එය අනවශ්‍යය ලෙස බලෙන් ඇති කිරීම අවශ්‍ය නැත. අවශ්‍ය පරිසරය ළඟා කළ විට පහසුකම් සැලැස්සූ විට වයසෙන් වැඩෙත් ම දරුවා පරිසරය සමඟ අන්තර් ක්‍රියාකාරකම් කරමින් පරිණතියට අනුකූලව බුද්ධි වර්ධනය කරගනු ඇත. මේ නිසා ළදරුවන්ට ඉගැන්වීමට උත්සාහ කරනු වෙනුවට ක්‍රියාකාරකම් කිරීමට ක්‍රීඩා කිරීමට උචිත යහපත් ප්‍රසන්න පරිසරයක් සපයා දීම වඩාත් බුද්ධිගෝචර වේ.

(ලකුණු 10)

(4) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රජා සංවර්ධනය සහ සමාජ සුභසාධනය යනාදිය සහතික කරන පහසුකම් සහ යාන්ත්‍රණයන් සමාජ යටිතල පහසුකම් යන්නට ඇතුළත් වේ. සෞඛ්‍ය සාක්ෂරතාවය සහ පාරිසරික තිරසාර බව යන දර්ශක වලින් පෙන්වන පරිදි ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වීම සහ ආර්ථික සෞභාග්‍යය ළඟාකර ගැනීම අතර දැඩි සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. රටක සමාජ යටිතල පහසුකම් දියුණුවීම, ඉහළ ආර්ථික වර්ධනයක් අභිමුඛ කොටගත් වඩාත් ඵලදායී සහ පූර්ණ නිපුණතා සහිත ශ්‍රම බලකායක් බිහිකිරීම කෙරෙහි බලපාන අතර එමඟින් වඩාත් වේගවත් ආර්ථික වර්ධනයකට සහ සංවර්ධනයකට යොමු වීම සඳහා රටට අවශ්‍ය පරිණතභාවය ලබා ගැනීම තහවුරු කරනු ඇත. අධ්‍යාපනය සහ සෞඛ්‍යය සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා ඍජුව දයකත්වයක් සැපයිය හැකි ප්‍රධාන සමාජ යටිතල පහසුකම් වශයෙන් හඳුනාගෙන ඇත.

1. සමාජ යටිතල පහසුකම් ලෙස ලේඛකයා හඳුන්වන කරුණු මොනවාද?
2. ශ්‍රම බලකායේ බිහිකිරීම කෙරෙහි බලපාන සාධකය ලෙස මෙහි දැක්වෙන්නේ කුමක්ද?
3. ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය වැඩි දියුණු වීම සහ ආර්ථික සෞභාග්‍යය ළඟා කර ගැනීම අතර පවත්නා දැඩි සම්බන්ධතාවය පෙන්නුම් කරන දර්ශකය කවරේ ද?
4. රටට අවශ්‍ය පරිණතභාවය ලබා ගැනීම තහවුරු වන්නේ කෙබඳු මාර්ගයක් යටතේ ද?
5. අධ්‍යාපනය හා සෞඛ්‍යය හඳුනාගෙන ඇත්තේ කවර කාර්යයන් සඳහා දයකත්වයක් සැපයෙන අංශයක් වශයෙන් ද?

(ලකුණු $2 \times 5 = 10$)

(5) පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන පුවත්පත් ප්‍රාදේශීය වාර්තාකරු ඔබ යැයි සිතා පුවත්පත් විශේෂාංග ලිපියක් සකසන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත්ය)

| | | |
|---|---|---|
| දිනය | - | 2025 ජූලි 11 |
| වේලාව | - | පෙ. ව. 9.00 – 10.00 |
| ස්ථානය | - | ගලෙන්බිඳුනු වැව ප්‍රජා ශාලාව |
| වැඩසටහන | - | ගොවි බිමට සවියක් |
| ප්‍රධානත්වය | - | මහාචාර්ය නාලක රණතුංග මහතා |
| සංවිධානය | - | ගලෙන්බිඳුනු වැව ගොවි සමිතිය |
| සහභාගීත්වය | - | ගලෙන්බිඳුනු වැව ගොවි ජනතාව |

**නැතහොත්**

මෙම දිනවල පවතින අධික වර්ෂාව නිසා අනුරාධපුර සිට වව්නියා මාර්ගයට සම්බන්ධ වන සුදුවැද්දගම අතුරු මාර්ගය සම්පූර්ණයෙන් ම කැඩී බිඳී අබලන් වී ඇත. එම නිසා ප්‍රදේශවාසීන්ගේ සියලු අවශ්‍යතා හා කාර්යයන් නැවතී ඇත. ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති යැයි සිතා මාර්ගය පිළිසකර කර ගැනීමට අනුරාධපුර ප්‍රාදේශීය ලේකම්ට යැවිය යුතු ලිපිය සකස් කරන්න.
(වචන 100ක් පමණ ප්‍රමාණවත්ය)

(ලකුණු 15)

★★★